## Abstract No 48

### ඉලත්තට්ටු නිර්මාණයෙහි ලා සංස්කෘත ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථාගත සිද්ධාන්තයන්ගේ බලපෑම

**පූජ්‍ය දේවගොඩ පියරතන හිමි,**
සංස්කෘත අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
**dewagoda1@yahoo.com**

ඉලත්තට්ටු, පඩික්කම්, ගිර, හුනුකිල්ලෝට, කලස් ආදි පුරාතන ශ්‍රී ලාංකේය ලෝහමය නිෂ්පාදන විශිෂ්ට නිර්මාණයෝ වෙති. නිවැරදි ප්‍රමිතියට අනුව කලාත්මක සැරසිලිවලින් අලංකාර කර ඒවා නිර්මාණය කිරීම එයට හේතුවකි. යථෝක්ත ලෝහමය නිර්මාණ නිෂ්පාදනයේ දී අත්‍යවශ්‍ය වූ ශිල්පීය ඥානය ශ්‍රී ලාංකේය ශිල්පීන්ට ප්‍රදානය කරන ලද්දේ සංස්කෘත ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථයන් ය. ඉලත්තට්ටු නිර්මාණය කිරීමේ දී ඉලත්තට්ටුවේ උස අඟල් 15, 11, හෝ 21 ක් විය යුතු බව ද ඉලත්තට්ටුවේ උසින් දෙකොටසක් එහි හිස් කුහරය වන අතර ඉතිරිය පාදාධාරය විය යුතු බව ද සංස්කෘත ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථාගත සිද්ධාන්තය යි. තව ද ඉලත්තට්ටුවේ මුහුණත පරිධිය පහෙන් බෙදූ විට එයින් කොටස් හතරක් පාදාධාරයේ පරිධියට සමාන විය යුතු ය. ඉලත්තට්ටුව යමක් මත සිටුවා තැබූ විට එය නොවැටී තිබෙන්නට මෙම සිද්ධාන්තය බෙහෙවින් ම වැදගත් ය. පාදාධාරය සිංහ ව්‍යාඝ්‍ර හංස කින්නර ආදි සත්ව රූපයන්ගෙන් අලංකාර කළ යුතු ය. සංස්කෘත ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථාගත යථෝක්ත සිද්ධාන්ත ශ්‍රී ලාංකේය ඉලත්තට්ටු නිර්මාණයෙහි ලා බලපා ඇති ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. තව ද නූතන ලෝහ නිර්මාණ ශිල්පීන්ට යථෝක්ත සිද්ධාන්ත හඳුන්වා දී නූතන ඉලත්තට්ටු නිර්මාණ විශිෂ්ටත්වයට පත් කර වීම ද මෙම පර්යේෂණයෙහි අරමුණකි. මේ සඳහා කොළඹ ජාතික කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, කොග්ගල මාර්ටින් වික්‍රමසිංහ ජන කෞතුකාගාරය ආදි ස්ථානයන්හි ද විවිධ ප්‍රදේශවල නිවැසියන් සතු ව පවතින ඉපැරණි ඉලත්තට්ටු ද නිරීක්ෂණයට භාජනය කරන ලදී. සංස්කෘත ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථාගත ශිල්පීය සිද්ධාන්ත, ඉලත්තට්ටු නිර්මාණයෙහි ලා බලපෑමක් සිදු කර තිබුණ ද කලාත්මක සිද්ධාන්තයන්ගේ බලපෑම ඉතා අවම මට්ටමක පැවැති බව මෙහිදී නිගමනය කරන ලදී. එහෙත් විවිධ කලාත්මක සැරසිලි යොදා ගනිමින් අලංකාර කරන ලද ඉලත්තට්ටු මෙහිදී නිරීක්ෂණය කරන ලදී. කුඩා ප්‍රමාණයේ ත්‍රිකෝණ සැරසිලි, බෝපත් සැරසිලි, ලියකම් සැරසිලි ඒ අතර දක්නට ලැබේ. ප්‍රභූවරුන්ට ආහාර පිළිගැන්වීම සඳහා පුරාතනයෙහි භාවිත සේරක්කල, ඉලත්තට්ටු නිර්මාණයෙහි ක්‍රමවිකාශයක් ලෙස අනාවරණය විය. නූතන ලෝහ භාණ්ඩ නිර්මාණ ශිල්පීන් විසින් නිෂ්පාදිත ඉලත්තට්ටු ද මෙහිදී නිරීක්ෂණය කරන ලදී. ඒවා නිසි ප්‍රමිතියෙන් යුක්ත නොවන අතර කලාත්මක භාවයෙන් හීනතාවක් පෙන්නුම් කරන බව ද අනාවරණය විය. සංස්කෘත ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථාගත ඉලත්තට්ටු නිර්මාණ සිද්ධාන්ත නූතන ලෝහ නිර්මාණ ශිල්පීන්ට හඳුන්වා දීමෙන් ඔවුන්ගේ නිර්මාණ විශිෂ්ටත්වයට පත් කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** ඉලත්තට්ටු , සිද්ධාන්ත , ශිල්පශාස්ත්‍ර , සංස්කෘත